# පෞරාණික රෝහණ දේශයේ බුද්ධ ප්‍රතිමා කලාව සහ එහි තාක්ෂණය පිළිබඳව ඓතිහාසික අධ්‍යයනයක්

ගයාන් තරිඳු වීරක්කොඩි ආරච්චි[1]

## හැඳින්වීම

අතීතයේ සිට ම ශ්‍රී ලංකාවේ ඓතිහාසික රෝහණ දේශයට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි. අතීතයේ දී ශ්‍රී ලංකාව රුහුණු, මායා, පිහිටි යන තුන් රාජ්‍යයෙන් සමන්විත විය. උතුරු දෙසින් මහවැලි ගඟින්, බටහිර දෙසින් කළු ගඟින් මායිම් වූ පුරාණ රෝහණයේ දකුණ හා නැගෙනහිර මහා සමුද්‍රයෙන් මායිම් වී තිබූ බව කඩයිම් පොත් විමර්ශනයෙන් පැහැදිලි වේ(අභයවර්ධන, 1965). රෝහණය හෙවත් රුහුණ විටෙක ස්වාධීන රාජ්‍යයක් ලෙසත් තවත් විටෙක උප රාජ්‍යයක් ලෙසත් ඇතැම් විට ආරක්ෂක මධ්‍යස්ථානයක් ලෙසත් ක්‍රියාත්මක වී තිබේ. එම ජාතික මෙහෙවරට සාපේක්ෂව දැවැන්ත බුද්ධ ප්‍රතිමා හා බෝධිසත්ව ප්‍රතිමා නිර්මාණය කේන්ද්‍ර කොට ගනිමින් බිහි කරන ලද කලාත්මක නිමැයුම් අතින්ද පුරාණ රෝහණ දේශවාසීන්ට අද්විතීය ස්ථානයක් හිමි වේ. ප්‍රස්තුත මාතෘකාව යටතේ පෞරාණික රෝහණ දේශයේ බුද්ධ ප්‍රතිමා කලාව පිළිබඳ පුළුල් අධ්‍යයනයක නියලීමට අපේක්ෂිතය.

බෞද්ධ කලා ශිල්ප අතර බුද්ධ ප්‍රතිමා කලාව ප්‍රමුඛ තැනක් හිමි කර ගනියි. මහායාන දර්ශනය වඩාත් ජනප්‍රිය ලෙස වර්ධනය වූ පසුබිමක මෙම ප්‍රතිමා නිර්මාණය වන්නේ බුද්ධ පරිනිර්වාණයෙන් බොහෝ කලකට පසුවය. බුද්ධ ප්‍රතිමාව මානව රූපීව නිර්මාණය නොකළේ ආගමික තහනමක් නිසා නොව බුදුන් වහන්සේ පිළිබඳව පැවති ශ්‍රද්ධා භක්තිය නිසා බව විශ්වාසය වේ. එබැවින් බුදුන් වහන්සේ වෙනුවට විවිධ සංකේත යොදා ගත් අතර පසු කාලීනව ඒවා පූජනීය වස්තු බවට පත් විය.

බුද්ධ පරිනිර්වාණයෙන් පසු බුදුන් වහන්සේගේ රූපය සම්පූර්ණයෙන් නොපෙනී යන නිසා ලෞකිකත්වය ඉක්මවා ගිය අධ්‍යාත්මිකත්වය විද්‍යමාන වන ආකාරයෙන් රමණීය ලෙස බුදුරුව නිර්මාණය කිරීමට යොමු විය. බුද්ධ ප්‍රතිමා නිර්මාණයේ ආරම්භය කවදා සිදු වී දැයි නිශ්චිත නොවුවද සාහිත්‍ය මූලාශ්‍ර වල බුදුන් ජීවමාන අවධියේ පටන් ප්‍රතිමා නිර්මාණය වූ බව සඳහන් කරයි. පුරාවිද්‍යාත්මක සාධක අනුව පැරණිම බුද්ධ ප්‍රතිමාව ක්‍රි.පූ. 01 හෝ 01 සියවසේ නිර්මාණය කරන්නට ඇතැයි විශ්වාස කළ හැකිය. බොහෝ විද්වතුන්ගේ මතය වන්නේ කුෂාණ වංශික කණිෂ්ක රජු දවස බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය සිදු වන්නට ඇති බවය.

ශ්‍රී ලංකාවේ දී බුද්ධ ප්‍රතිමා නිර්මාණය වන්නේ මහින්දාගමනයෙන් පසුවය. බුද්ධ ප්‍රතිමාවක් පිළිබඳ මුල් ම සාහිත්‍යමය සාක්ෂි හමුවන්නේ මහාවංසයෙනි

1 සහකාර කථිකාචාර්ය ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, gayantharindu1987@gmail.com

(මහාවංසය, 1955). ඒ දුටුගැමුණු රජු දවසය. අනතුරුව මහාවංසයේ විටින් විට බුද්ධ ප්‍රතිමා නිර්මාණය ගැන සඳහන් කර ඇති නමුත් ක්‍රි.ව. 4 වන සියවසෙන් පසු සවිස්තරාත්මක ලෙස බුද්ධ ප්‍රතිමා හා පිළිම ගෙවල් නිර්මාණ පිළිබඳව සඳහන් වේ. රජරටට සාපේක්ෂව ප්‍රාදේශීය රාජ්‍යවලද ප්‍රතිමා නිර්මාණ බිහි විය. ඒ අතරින් රෝහණය ප්‍රධාන වේ. රෝහණයට ආවේණික වූ ලක්ෂණ හා අනන්‍යතාව මත විශිෂ්ට අයුරින් ගොඩ නැගුණු ප්‍රතිමා කලාවක් පැවති බවට ප්‍රමාණවත් තරම් සාක්ෂි පවතී. එබැවින් රෝහණයේ බුද්ධ ප්‍රතිමා පිළිබඳව අධ්‍යයනය කිරීම බෙහෙවින් ම වැදගත්වේ.

රජරට රාජධානියේ නිර්මාණය වූ අවුකන ප්‍රතිමාව, මහමෙව්නාවේ සමාධි බුද්ධ ප්‍රතිමාව, තොලුවිල සමාධි පිළිමය, ගල් විහාරයේ ප්‍රතිමා ප්‍රමුඛ අනුරාධපුර හා පොළොන්නරු යුගයේ පිළිමවලට සමාන්තරව රෝහණ දේශයේ ද විශිෂ්ට ප්‍රතිමා රාශියක් බිහි විය. මාළිගාවිල, යටාල, බුදුරුවගල, සිතුල්පව්ව, තිස්සමහාරාමය, රම්බාවිහාරය, දෙමටමල්විහාරය, මුහුදුමහවිහාරය සඳගිරි වෙහෙර ආදී ස්ථාන වල පිහිටි බුද්ධ ප්‍රතිමා විශිෂ්ට ගණයේ නිර්මාණයන් වේ. නමුත් මෙම ස්ථාන වල ඇති ප්‍රතිමා බොහොමයක් අනාරක්ෂිත බව හා නිධන් හොරුන්ගේ තර්ජනය හමුවේ හානියට ලක් වීය.

විශාල ප්‍රතිමා ගෘහයක් සහිතව මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල පිහිටි මාලිගාවිල බුද්ධ ප්‍රතිමාව රෝහණ ශිල්පියාගේ දක්ෂතාවය මැනවින් ප්‍රකට කරයි. මෙම ප්‍රතිමාව ක්‍රි.ව. 7 සියවසේ දී අග්‍රබෝධි රජු විසින් නිර්මාණය කරන්නට ඇතැයි සැළකෙන අතර එය සමීපයේ ලංකාවේ විශාලතම බෝධිසත්ව ප්‍රතිමාව වූ දඹේගොඩ අවලෝකිතේශ්වර ප්‍රතිමාව පිහිටා තිබීම මෙම ස්ථානයේ අගය තවත් ඉහළනැංවීමට හේතු වේ. පද්මාසනය සමඟ අඩි 41 අඟල් 10 ක් උසින් යුක්තව අභය මුද්‍රාවෙන් නිර්මිත මෙම සෙල්මුවා පිළිමය පිහිටි ගලේ කළ නිර්මාණයක් නොව වෙනත් ස්ථානයක පිහිටි ගල් වලක නිමවා මෙහි ගෙනවිත් සිටුවා තැබීමෙන් රෝහණ ශිල්පියාගේ විශිෂ්ටත්වය මොනවට කියාපායි.

උපරාජ මහානාගගේ පුත් කුමරු යටාලතිස්ස උපන් ස්ථානය ලෙස සැළකෙන හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්ස නගරය සමීපයේ යටාල පිහිටි ඉපැරණි දාගැබ සහිත පුරා පරිශ්‍රයේ ඇති පුරාවිද්‍යා කෞතුකාගාරයේ තැන්පත් කොට ඇති සහ චෛත්‍ය මළුවේ ඇති හිටි පිළිම, ත්‍රිභංග ප්‍රතිමාව, ආදී ප්‍රතිමා රෝහණ ශිල්පියාගේ කුසලතාව මැනවින් ප්‍රකට කරයි. පරදුක්ඛදුක්ඛිත මුද්‍රාව නිරූපනය කෙරෙන ත්‍රිභංග ප්‍රතිමාව අවුකන පිළිමය හැරුණු විට මෙරට ඇති දුර්ලභ ගණයේ හිටි ප්‍රතිමාවකි. කෞතුකාගාරයේ තැන්පත් කොට ඇති බුද්ධ ප්‍රතිමා ශීර්ෂය ලෝකප්‍රකට එකකි. එය පසුකාලීනව සොරුන්ගේ අතට පත් විය.

වැල්ලවාය නගරය සමීපයේ මහ වනයේ පිහිටි බුදුරුවගල අඩි 50 උස ගල් පර්වතයක බුදු රුව මැදි වනසේ දෙපස බෝධිසත්ව රූප 4 ක් සහිතව නිර්මාණය කොට ඇති ප්‍රතිමා පංතිය ක්‍රි.ව. 7-10 සියවස් වලට අයත් බව පරණවිතාන මතය වේ.(ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, වෙළුම 01 කාණ්ඩය 01 387 පිටුව). අවුකන ප්‍රතිමාව තරම් ඉස්මතු නොවුනද අවුකන පිළිමය තරම් විශාලවූ එය අභය මුද්‍රාවෙන් යුක්තව පද්මාසනය මත හිඳුවා ඇත.

පැරණි බුද්ධ ප්‍රතිමා කලාවේ නවතාල දසතාල ශිල්පීය ක්‍රමවේදය සහ ගල් වඩුවන් විසින් භාවිතා කරන ලද වෘත්තීය ශිල්පීය ක්‍රම පිළිබඳව මෙහිදී විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් රෝහණ දේශයේ පැරණි බුද්ධ ප්‍රතිමා ශිල්පීය පරම්පරා පිළිබඳව ද පළල් වශයෙන් අධ්‍යයනයක් තියලීමට අපේක්ෂිතය.

**පර්යේෂණ ගැටලුව**

මෙරට ඉතිහාසයේ සුවිශේෂ සංධිස්ථානයක් සනිටුහන් කරන ලද රෝහණ දේශයේ ඉතිහාසය පිළිබඳව විධිමත් අධ්‍යයනයක් සිදු නොවීම නිසා රජරට ශිෂ්ටාචාරයට සාපේක්ෂව රෝහණයේ පැවති බුද්ධ ප්‍රතිමා කලාව පිළිබඳ විධිමත් අධ්‍යයනයක් සිදු නොවීය. එම ගැටලුව විසඳීම සඳහා මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී තවත් අධ්‍යයන ප්‍රශ්න ගණනාවකට මුහුණ දීමට සිදු විය. එනම්

- රෝහණයේ බුද්ධ ප්‍රතිමාවල කලාත්මක පාර්ශ්වය හා එහි ස්වභාවය
- මුද්‍රා භාවිතය
- තාක්ෂණික ඥානය
- රෝහණයේ බුද්ධ ප්‍රතිමාවල ඇති සුවිශේෂතා යන විවිධ ක්ෂේත්‍ර වලට අදාළ ගැටලු ඒ අතර වේ.

**පර්යේෂණයේ තත්කාලීන වැදගත්කම**

- ශ්‍රී ලංකාවේ ප්‍රධාන ඉතිහාස සම්ප්‍රදායන් රජරටට පමණක් කේන්ද්‍ර කරගත් හෙයින් එකී ඉතිහාස ධාරාවෙන් රෝහණ දේශයේ ඉතිහාසය ගිලිහී යාම හේතු කොට ගෙන එහි වූ කලාශිල්ප ද නිසි ඇගයීමකට ලක් නොවීමේ ඌනතාවය මඟ හැරවීම.
- රෝහණ දේශයේ විසිරී ඇති බුද්ධ ප්‍රතිමා අධ්‍යයනය කිරීමෙන් තත්කාලීන අවධියේදී එම ප්‍රදේශවල තිබූ සමාජ, සංස්කෘතික සහ ආර්ථික වපසරිය අවබෝධ කර ගත හැකි වීම.
- මෙම කලා කෘති වලට අනුව සමකාලීන යුගයේ ජීවත් වූ ජනතාවගේ නිදහස් චින්තනය සිතුම් පැතුම් පූජා විධි චාරිත්‍ර-වාරිත්‍ර යන විෂයයන් පිලිබඳ අධ්‍යයනය කිරීම.

**අධ්‍යයනයේ අරමුණු**

- සමස්තයක් ලෙස ලංකාවේ බුද්ධ ප්‍රතිමා කලාව පිළිබඳව කරුණු සඳහන් වුවද රෝහණයේ බුද්ධ ප්‍රතිමා කලාව පිළිබඳ ලසු ශාස්ත්‍රීය අධ්‍යයනය සීමිතය. එබැවින් ඒ කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කිරීම
- අතීත රෝහණ දේශයේ බුද්ධ ප්‍රතිමා කලාවේ විශේෂ ලක්ෂණ, තාක්ෂණික ක්‍රම වේදය, මුද්‍රා භාවිතය ආදී ක්ෂේත්‍ර අධ්‍යයනය කිරීම

- ප්‍රතිමා නිර්මාණය කළ නිහඬ කලාකරුවන් පිළිබඳව කරුණු එක් රැස් කිරීම හා යම් ඇගයීමක් කිරීම
- රෝහණ දේශයේ කලා ඉතිහාසය ප්‍රධාන ඉතිහාස ධාරාවට බද්ධ කිරීම

**සමාලෝචනය හා නිගමන**

බුද්ධ ප්‍රතිමා නිර්මාණය පරිනිර්වාණයෙන් බොහෝ කලෙකට පසු සිදු විය. බුදුන් වහන්සේ කෙරෙහි පැවති අසීමිත ශ්‍රද්ධාව හා භක්තිය නිසාවෙන් මුල්කාලයේ ප්‍රතිමා නිර්මාණය නොවුවද මහායාන බලපෑමත්, බුදුන් වහන්සේගේ රුව සම්පූර්ණයෙන් නොපෙනී යන නිසාත්, උන් වහන්සේගේ අනන්ත ගුණ සමුදාය විශේෂයෙන්ම සිත් පිත් නැති කළු ගලක නිර්මාණය කිරීමට, කලා කරුවා පෙළඹිණි. ඒ අනුව රජරට රාජධානියට අමතරව රෝහණය වැනි ප්‍රාදේශීය රාජ්‍යවලද විශිෂ්ට නිර්මාණ බිහි විය. රෝහණයේ බුද්ධ ප්‍රතිමා නිර්මාණය වූ සෑම තැනකම පාහේ ඊට සමගාමීව ඒ ආසන්නයේ ම බෝධිසත්ව ප්‍රතිමා ද ගොඩ නැගිණ. මෙයට හේතුව වන්නට ඇත්තේ මහායාන අදහස් වල බලපෑම රෝහණය තුළ ද ක්‍රියාත්මකවීම විය හැකිය. නමුත් රජරට තත්වය මීට වඩා වෙනස් වූ බව පෙනේ. එහි තැණුන බුද්ධ ප්‍රතිමා සමග බෝධිසත්ව ප්‍රතිමා ගොඩ නොනැගුණි. මෙකී ස්වභාවය හේතු කොට ගෙන රෝහණ ප්‍රතිමා ශිල්පියා මේ දෙයාකාරයෙන් ම පිළිම නෙළීම පිළිබඳ පරිචයක් ලද අයෙකු බව පැහැදිලිය. මෙම අධ්‍යයනය මගින් මෙතෙක් ගැඹුරින් අවධානයට යොමු නොවූ රෝහණ දේශයේ පිළිම කලාව පිළිබඳව නව දැනුම විශ්ලේෂණය කිරීමට හා එකී නව දැනුම සමාජගත කිරීමට අපේක්ෂිතය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

*මහාවංසය,* (1955). පොල්වත්තේ බුද්ධදත්ත සංස්කරණය, කොළඹ.

*ධාතුවංසය,* (1940). වටද්දර පඤ්ඤාසාර සංස්කරණය, කොළඹ.

අභයවර්ධන එච්.ඒ.පී. (1965). කොළඹ: කඩයිම් පොත් විමර්ශනය

කුමාරස්වාමි, ආනන්ද (1962). *බුදු පිළිමයේ උපත.* කොළඹ.

වනරතන හිමි, කඹුරුපිටියේ (1985). *ලක්දිව බුදු පිළිමය*

ලගමුව, ඒ (1999). *ශ්‍රී ලංකාවේ බුද්ධ ප්‍රතිමා ලක්ෂණ.* මධ්‍යම සංස්කෘතික අරමුදල